අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2025 (2026)
கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை - 2025 (2026)
General Certificate of Education (Ordinary Level) Examination - 2025 (2026)

# භූගෝල විද්‍යාව
# Geography - புவியியல்

## අනුහුරු ප්‍රශ්න පත්‍රය
## பயிற்சி வினாத்தாள்
## Practice Paper



**ප්‍රශ්න පත්‍රය - I, II | Question Paper - I, II | (සිංහල මාධ්‍යය)**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு – தேசிய மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு
Ministry of Education, Higher Education & Vocational Education - National Languages and Humanities Branch

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம்
Ministry of Education, Higher Education & Vocational Education

| 61 | S | I, II |
|---|---|---|

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)
G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**භූගෝල විද්‍යාව - I** විභාග අංකය:......................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස් තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවි තලයේ සිට 5 - 6 km අතර කලාපය තුළ මුළු වායු පරිමාවෙන් .................................... ක් පමණ අන්තර්ගත වේ.
(18% / 50% / 97%)

**2.** පොල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු කරන පොල් පර්යේෂණ ආයතනයක් ...................................... ප්‍රදේශයේ පිහිටා ඇත.
(ඇඹිලිපිටිය / රත්න / බතලගොඩ)

**3.** 'කර්මාන්ත ගම්මාන' ඇති කරන ලද්දේ ...................................... කර්මාන්ත සංවර්ධනය සඳහා ය.
(නිෂ්පාදන / අපනයන / ගෘහ)

**4.** නාවික සැතපුම් 24 සිට 200 දක්වා වූ කලාපය ...................................... ලෙස හඳුන්වයි.
(පරම ආර්ථික කලාපය / යාබද කලාපය / රාජ්‍යීය මුහුදු සීමාව)

**5.** දකුණු ආසියානු කලාපයේ ඉහළ ම මානුෂ සංවර්ධනයක් සහිත රට වන්නේ ...................................... යි.
(ඉන්දියාව / ශ්‍රී ලංකාව / මාලදිවයින)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ මිනිරන් කැණීම් සිදු කරන්නේ පතල් දෙකක පමණි. **නි / වැ**
**7.** ඍතු භේදය නිසා සෞම්‍ය කලාපයේ උෂ්ණත්වය අඩු වැඩි වේ. **නි / වැ**
**8.** සෑම ඛනිජයක ම නියත රසායනික සංයුතියක් ඇත. **නි / වැ**
**9.** පාෂාණවල ඝනත්වය, සංයුතිය සහ පිහිටීම අනුව පෘථිවි කබොලේ ප්‍රධාන කොටස් තුනක් ඇත. **නි / වැ**
**10.** භෞතික ජීවන තත්ත්ව දර්ශකය රටක සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන පැරණි මිනුමකි. **නි / වැ**

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස් තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය මගින් ප්‍රධාන සංචාරක කලාප .......................................... ක් හඳුනා ගෙන ඇත.

**12.** ග්‍රැනයිට් විපරිත වීමෙන් .......................................... පාෂාණ නිර්මාණය වේ.

**13.** ...................................... , විශේෂ ප්‍රාගුණ්‍යය හා තාක්ෂණයේ දියුණුව එකලස් කිරීමේ කර්මාන්තයක මූලික පදනම් වේ.


**14.** වර්ග කිලෝමීටරයක ජීවත් වන ජන සංඛ්‍යාව .......................................... ලෙස හඳුන්වයි.

**15.** ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන ..........................................වල බලපෑමෙන් භූ තැටි චලනය වේ.

**16.** සාගරවලට සම්බන්ධ වූ හෝ ගොඩ බිම්වලින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් වට වූ කරදිය ප්‍රදේශ ..................... ලෙස හඳුන්වයි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

**ශ්‍රී ලංකාවට ජනවාරි සිට ජුනි දක්වා සංචාරක පැමිණීම් (2023 හා 2025)**




**17.** 2023 වර්ෂයේ වැඩිම සංචාරක පැමිණීම .................................... මාසයේ දී වාර්තා වී ඇත.

**18.** 2025 වර්ෂයේ අඩුම සංචාරක පැමිණීම .................................... මාසයේ දී සිදු වී ඇත.

**19.** 2023 හා 2025 වර්ෂවල සංචාරක පැමිණීම් අතර වැඩිම වෙනසක් දක්නට ලැබෙනුයේ .................................... මාසයේ දී ය.

- අංක **20** සිට **25** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| **'අ'** ජනාධික කලාපය | **'ආ'** රට |
|---|---|
| 1. දකුණු ආසියාව | A - ඉන්දුනීසියාව |
| 2. අග්නිදිග ආසියාව | B - චීනය |
| 3. නැගෙනහිර ආසියාව | C - රුසියාව |
| | D - පාකිස්ථානය |

(1) A, D, B (2) B, C, A (3) C, A, B (4) D, A, B (.......)

**21.**

| **'අ'** ඛනිජ වර්ගය | **'ආ'** උදාහරණ |
|---|---|
| 1. බලශක්තිමය ඛනිජ | A - යපස් |
| 2. ලෝහමය ඛනිජ | B - මිනිරන් |
| 3. ලෝහමය නොවන ඛනිජ | C - හුණුගල් |
| | D - ගල් අඟුරු |

(1) B, A, D (2) C, B, A (3) D, A, C (4) D, B, C (.......)

**22.**

| **'අ'** ගංගාව | **'ආ'** ආරම්භය |
|---|---|
| 1. රයින් | A - උල්පතකින් |
| 2. නයිල් | B - ග්ලැසියර් දිය වූ ජලයෙන් |
| 3. තේම්ස් | C - විලකින් |
| | D - කඳුකර ප්‍රදේශයක උල්පතකින් |

(1) A, C, B (2) B, C, A (3) C, B, D (4) D, C, A (.......)

**23.** ‘අ’ **සංචාරක කලාපය**

1. පුරාණ නගර
2. දකුණු වෙරළබඩ
3. මධ්‍යම කඳුකරය

‘ආ’ **නගරය**

A - මහනුවර
B - හික්කඩුව
C - නුවරඑළිය
D - කතරගම

(1) A, D, C (2) B, D, C (3) D, B, A (4) D, B, C (…….)

**24.** ‘අ’ **භූ තැටිය**

1. ඉන්දු-ඕස්ට්‍රේලියානු
2. යුරේසියන්
3. දකුණු ඇමරිකානු

‘ආ’ **දූපත**

A - සුමාත්‍රා
B - හවායි
C - අන්දමන්
D - ෆෝක්ලන්ඩ්

(1) A, B, D (2) B, C, A (3) C, A, D (4) D, C, B (…….)

**25.** ‘අ’ **වනජීවී රක්ෂිත**

1. ස්වාභාවික රක්ෂිත
2. වන රක්ෂිත
3. ජාතික උද්‍යාන

‘ආ’ **ව්‍යාප්ත ප්‍රදේශ**

A - වැටහිරියාකන්ද
B - නාකියාදෙනිය
C - බූන්දල
D - යාල

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, C, A (…….)

- අංක **26** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට **හිමි අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**26.** ලෝක නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත වෙළෙඳපොළ ගැටලුවක් දැක්වෙන වරණය මින් කුමක් ද?
(1) අධික තරගකාරිත්වය නිසා භාණ්ඩවල මිල වෙනස් වීම
(2) බහුජාතික සමාගම්වල බලපෑමට හසු වීම
(3) ශ්‍රම වියදම් ඉහළ යාම
(4) නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා රැකියා හිඟයක් ඇතිවීම (…….)

**27.** ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය තුළ සිදු කෙරෙන ධීවර කර්මාන්තය හඳුන්වනු ලබන්නේ,
(1) කිවුල් දිය ධීවර කර්මාන්තය නමින් ය.
(2) බහු-දින ධීවර කර්මාන්තය නමින් ය.
(3) මිරිදිය ධීවර කර්මාන්තය නමින් ය.
(4) කරදිය ධීවර කර්මාන්තය නමින් ය. (…….)

**28.** ශ්‍රී ලංකාවේ වැඩි ම බිම් ප්‍රමාණයක වී වගා කරන්නේ මින් කුමන දිස්ත්‍රික්කයේ ද?
(1) නුවරඑළිය (2) පොළොන්නරුව (3) කුරුණෑගල (4) අනුරාධපුරය (…….)

**29.** මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ කැපී පෙනෙන ප්‍රවණතාවක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) කුඩා ප්‍රාග්ධන ආයෝජනයකින් පවත්වා ගෙන යා හැකි වීම
(2) රටවල් ඒකාබද්ධ ව නිෂ්පාදන සිදු කිරීම
(3) යුරෝපා රටවල් පමණක් නිෂ්පාදනයේ නියැලීම
(4) නිෂ්පාදන මාදිලි වෙනස් වීමට දිගු කාලයක් ගත වීම (…….)

**30.** තේ වගාව හා සම්බන්ධයෙන් වැදගත්කමක් උසුලන දකුණු ඇමරිකානු රට වන්නේ මින් කුමක් ද?
(1) බ්‍රසීලය (2) චිලී (3) උරුගුවේ (4) ආර්ජන්ටිනාව (…….)

**31.** අප්‍රිකා මහාද්වීපයේ ව්‍යාප්තව ඇති ද්විතියික ජන සංකේන්ද්‍රණයක් වන්නේ,
(1) කොංගෝ ද්‍රෝණිය ආශ්‍රිත කලාපය යි.
(2) මධ්‍යම සහරා ප්‍රදේශය යි.
(3) ඊජිප්තුවේ කයිරෝ නගරය ආශ්‍රිත කලාපය යි.
(4) රියෝ ද ජැනෙයිරෝ නගරය ආශ්‍රිත කලාපය යි. (…….)

**32.** ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජන සංගණනයක් සිදු කරන ලද්දේ,
(1) 1871 දී ය. (2) 1881 දී ය. (3) 1981 දී ය. (4) 2012 දී ය. (…….)

**33.** රටක සංවර්ධන ක්‍රියාදාමයේ දී විකල්ප සම්පත් සෙවීමට සිදු වන්නේ,
(1) ගෝලීය උෂ්ණත්වය වැඩි වන නිසා ය.
(2) ඕසෝන් වියනට හානි සිදු වන නිසා ය.
(3) සම්පත් වේගයෙන් ක්ෂය වන නිසා ය.
(4) සම්පත් ආර්ථික වශයෙන් වටිනා නිසා ය. (…….)

**34.** 2025 ජනවාරි මාසයේ දී මහත් විනාශයක් සිදු කරමින් දැවැන්ත ලැව් ගින්නක් පැතිර ගියේ ,
(1) ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ය.
(2) කැනඩාවේ ඇල්බර්ටාවල ය.
(3) ඇමසන් වනාන්තර ප්‍රදේශයේ ය.
(4) මධ්‍යම ඕස්ට්‍රේලියානු ප්‍රදේශයේ ය. (…….)

**35.** 1:50,000 භූ ලක්ෂණ සිතියමක ඉහළ වට තීරුවේ අඩංගු **නොවන** තොරතුරක් වන්නේ මින් කුමක් ද?
(1) සිතියම් වර්ගය
(2) සිතියම් අංකය
(3) සිතියමේ පරිමාණය
(4) සිතියමේ නම (…….)

**36.** ආපදා කළමනාකරණයට අදාළ ආයතනික ව්‍යුහය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - ආපදා කළමනාකරණය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවා ඇත.
B - අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු යටතේ ජාතික ආපදා කළමනාකරණය මධ්‍යස්ථානය පිහිටුවා ඇත.
C - ග්‍රාමීය මට්ටමින් ආපදා කළමනාකරණ කමිටු පිහිටුවා ඇත.
D - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු දේශපාලන නායකත්වය යටතේ සිදු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A, B සහ D පමණක් නිවැරදි ය.
(2) A සහ D පමණක් නිවැරදි ය.
(3) B සහ C පමණක් නිවැරදි ය.
(4) B සහ D පමණක් නිවැරදි ය. (…….)

**37.** ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝට්ටු අපනයනය කරනු ලබන යුරෝපා රටක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රංශය (2) නෙදර්ලන්තය (3) ඉතාලිය (4) නෝර්වේ (…….)

- පහත **A, B, C** හා **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. ස්වාභාවික ආපදා
2. මානව කටයුතු

B - 1. ආයු අපේක්ෂාව
2. වියපත් වීම

C - 1. වායු ඝනත්වය
2. උන්නතාංශය

D - 1. ආගමන
2. විගමන

**38.** දෙවැන්න වැඩි වන විට පළමුවැන්න අඩු වන මාතෘකා යුගලය කුමක් ද ?
(1) A (2) B (3) C (4) D (…….)

**39.** පළමුවැන්න වැඩි වන විට දෙවැන්න වැඩි වන මාතෘකා යුගලය කුමක් ද ?
(1) A (2) B (3) C (4) D (…….)

**40.** දෙවැන්නේ බලපෑමෙන් පළමුවැන්න තීව්‍ර වන මාතෘකා යුගලය කුමක් ද ?
(1) A (2) B (3) C (4) D (…….)

* * * *

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம்
Ministry of Education, Higher Education & Vocational Education

| 61 | S | I, II |
|---|---|---|

**අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)**
**G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

## භූගෝල විද්‍යාව - II

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් ප්‍රශ්නවලට පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. Ⓐ අක්ෂරයෙන් දැක්වෙන මායිම කුමක් ද?
(පළාත් / දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ) (ලකුණු 01 යි)

ii. Ⓑ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(අධිපාර / අප්‍රධාන මාර්ගය / කරත්ත පාර) (ලකුණු 01 යි)

iii. Ⓒ අක්ෂරයෙන් දැක්වෙන ජලවහන ලක්ෂණය කුමක් ද?
(කඩොලාන / ගං දහරය / වගුරු බිම) (ලකුණු 01 යි)

iv. Ⓓ අක්ෂරයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
(පාලම / බෝක්කුව / අඩි පාලම) (ලකුණු 01 යි)

v. Ⓔ අක්ෂරයෙන් දැක්වෙන වෙරළබඩ ලක්ෂණය කුමක් ද?
(තුඩුව / වැලි පරය / බොක්ක) (ලකුණු 01 යි)

vi. Ⓖ අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

vii. Ⓗ චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ආගමික සිද්ධස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (viii) හා (ix) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංක ඉදිරියෙන් ලියා දක්වන්න.

viii. ප්‍රදේශයේ ගංගා නිම්න ආශ්‍රිත ව බහුල ව රබර් වගාව දක්නට ලැබේ. (ලකුණු 01 යි)

ix. Ⓕ අක්ෂරයෙන් දැක්වෙන්නේ ජාතික ඛණ්ඩාංක ඡේදනය වන ස්ථානයකි. (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. තායිවානය - Ⓢ, Ⓣ, Ⓤ
ii. ඔබ් ගඟ - Ⓜ, Ⓝ, Ⓞ
iii. කළු මුහුද - Ⓥ, Ⓦ, Ⓧ
iv. පාමීර් සානුව - Ⓒ, Ⓓ, Ⓔ
v. වැඩ් විල - Ⓟ, Ⓠ, Ⓡ (ලකුණු 05 යි)


(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. ඒකල - Ⓖ, Ⓗ, Ⓘ
ii. ඩෙල්ෆ්ට් දූපත - Ⓐ, Ⓑ, Ⓒ
iii. සාම්පූර් - Ⓓ, Ⓔ, Ⓕ
iv. ඔක්කම්පිටිය - Ⓞ, Ⓟ, Ⓠ
v. ගිං ගඟ - Ⓛ, Ⓜ, Ⓝ (ලකුණු 05 යි)

## II කොටස

2. (i) මෙම රූප සටහනෙහි A හා B ලෙස දක්වා ඇති ලක්ෂණ නිවැරදිව නම් කරන්න. (ලකුණු 02 යි)




(ii) පහත දැක්වෙන දූපත් පිහිටි සාගර ප්‍රදේශ නම් කරන්න.
(a) කැනරි දූපත්
(b) පැපුවා නිව් ගිනියාව
(c) මැඩගස්කරය
(ලකුණු 03 යි)

(iii) (a) කිසියම් රටක් දූපතක් වශයෙන් පිහිටීමෙන් එම රටට ඇති වන **අවාසි දෙකක්** සඳහන් කරන්න.

(b) සාගරික ප්‍රදේශයක් හිමි රටවල් සාගරය පදනම් කර ගෙන සිදු කරන ආර්ථික කටයුතු **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 05 යි)

3. (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවන වායුගෝලයට එකතුවන අහිතකර වායු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දේශගුණ වෙනස් වීම් අවම කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාර **තුනක්** නම් කර ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

4. (i) පහත දැක්වෙන උපද්‍රව වර්ග සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.
(a) භූ විද්‍යාත්මක උපද්‍රව
(b) ජීව විද්‍යාත්මක උපද්‍රව (ලකුණු 02 යි)

(ii) පහත සාගරික කලාපවල ඇතිවන සුළි කුණාටු හඳුන්වනු ලබන නම් නිවැරදිව දක්වන්න.
(a) උතුරු අත්ලන්තික් සාගර ප්‍රදේශයේ දී
(b) බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරයේ දී
(c) පිලිපීන දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ දී (ලකුණු 03 යි)

(iii) ආපදා කළමනාකරණ චක්‍රයට අනුව ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදාව කළමනාකරණය කිරීමේ දී,
(a) අවම කිරීමේ ක්‍රියාමාර්ග **දෙකක්**
(b) යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග **තුනක්**
දක්වන්න. (ලකුණු 05 යි)

5. (i) පෘථිවියේ දක්නට ලැබෙන,
   (a) ක්ෂය වන සම්පතක්
   (b) පුනර්ජනනීය සම්පතක්
   නම් කරන්න. (ලකුණු 02 යි)

   (ii) වරහන් තුළ දක්වා ඇති පාෂාණ අතුරෙන්,
   (මිනිරන් / බැසෝල්ට් / ගල් අඟුරු / ගැබ්රෝ / ජිප්සම් / ඩොලමයිට්)
   (a) ආග්නේය පාෂාණයක්
   (b) අවසාදිත පාෂාණයක්
   (c) විපරීත පාෂාණයක්
   බැගින් තෝරා ලියන්න. (ලකුණු 03 යි)


   (iii) පරිසරයේ ඇති ස්වාභාවික සම්පත් මිනිසා විසින් වටිනා සම්පතක් බවට පරිවර්තනය කරන ආකාර **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. (i) (a) ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීම සඳහා පිහිටුවා ඇති පර්යේෂණ මධ්‍යස්ථානයක් නම් කරන්න.
   (b) සෞම්‍ය කලාපීය ප්‍රදේශවල කිරිපට්ටි පාලනය දියුණු වීම සඳහා බලපෑ සාධකයක් දක්වන්න. (ලකුණු 02 යි)

   (ii) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

   (iii) ගෝලීය දේශගුණ වෙනස් වීම් සත්ත්ව පාලන කටයුතු කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් **තුනක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

7. (i) ශ්‍රී ලංකාවේ විදුලි බලාගාර කිහිපයක් මෙම සිතියමෙහි ලකුණු කර ඇත. ඒවා අතරින්,
   (a) සූර්ය බලාගාරයක්
   (b) තාප බලාගාරයක්
   අක්ෂරය සමඟ නිවැරදිව නම් කරන්න. (ලකුණු 02 යි)




   (ii) බලශක්තිය ක්‍රමවත් භාවිත කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

   (iii) ශ්‍රී ලංකාවේ බලශක්ති පරිභරණයේ දී මතු වන ගැටලු **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

8. (i) 2024 ජන සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ
   (a) ජන සංඛ්‍යාව වැඩි ම දිස්ත්‍රික්කය
   (b) ජන සංඛ්‍යාව අඩු ම දිස්ත්‍රික්කය
   නම් කරන්න. (ලකුණු 02 යි)

   (ii) ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන
   (a) භෞතික සාධකයක්
   (b) මානව සාධක **දෙකක්**
   දක්වන්න. (ලකුණු 03 යි)

   (iii) සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනය හේතුවෙන් මතු වී ඇති ගැටලු **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

*****

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)
G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

විභාග අංකය:....................................

1· (අ) / (a)

i. ----------------------------------------------------------------------------------------

ii. ----------------------------------------------------------------------------------------

iii. ----------------------------------------------------------------------------------------

iv. ----------------------------------------------------------------------------------------

v. ----------------------------------------------------------------------------------------

vi. ----------------------------------------------------------------------------------------

vii. ----------------------------------------------------------------------------------------


----------------------------------------------------------------------------------------

viii. ----------------------------------------------------------------------------------------

ix. ----------------------------------------------------------------------------------------


/10

(ආ)/(b)




| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (iv) | |
| (v) | |
| | 5 |

(ඉ)/(c)




| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (iv) | |
| (v) | |
| | 5 |

1. (අ) (a) $\frac{}{10}$ (ආ) (b) $\frac{}{5}$ (ඉ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி,உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education & Vocational Education**

| 61 | II |
|---|---|

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)
**G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)**
கல்வி பொதுத் தராதரப் பத்திர(சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாப்பத்திரம் - 2025 (2026)

භූගෝල විද්‍යාව - **Geography** - புவியியல் - II




**1:50,000**

2025(2026) OL/61/S/A

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2025 (2026)
கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை - 2025 (2026)
General Certificate of Education (Ordinary Level) Examination - 2025 (2026)

# භූගෝල විද්‍යාව
## Geography - புவியியல்

**අනුහුරු ප්‍රශ්න පත්‍රය**
**பயிற்சி வினாத்தாள்**
**Practice Paper**



**පිළිතුරු පත්‍රය - I, II | Answer Sheet - I, II | (සිංහල මාධ්‍යය)**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு – தேசிய மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு
Ministry of Education, Higher Education & Vocational Education - National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம்
Ministry of Education, Higher Education & Vocational Education

61 | S | I, II

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)
G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## භූගෝල විද්‍යාව - I

විභාග අංකය:......................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවි තලයේ සිට 5 - 6 km අතර කලාපය තුළ මුළු වායු පරිමාවෙන් ..........**50%**.......... ක් පමණ අන්තර්ගත වේ. (18% / 50% / 97%)

**2.** පොල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු කරන පොල් පර්යේෂණ ආයතනයක් ..........**ඇඹිලිපිටිය**.......... ප්‍රදේශයේ පිහිටා ඇත. (ඇඹිලිපිටිය / රත්න / බතලගොඩ)

**3.** 'කර්මාන්ත ගම්මාන' ඇති කරන ලද්දේ ..........**ගෘහ**.......... කර්මාන්ත සංවර්ධනය සඳහා ය. (නිෂ්පාදන / අපනයන / ගෘහ)

**4.** නාවික සැතපුම් 24 සිට 200 දක්වා වූ කලාපය ..........**පරම ආර්ථික කලාපය**.......... ලෙස හඳුන්වයි. (පරම ආර්ථික කලාපය / යාබද කලාපය / රාජ්‍ය මුහුදු සීමාව)

**5.** දකුණු ආසියානු කලාපයේ ඉහළ ම මානුෂ සංවර්ධනයක් සහිත රට වන්නේ ..........**ශ්‍රී ලංකාව**.......... යි. (ඉන්දියාව / ශ්‍රී ලංකාව / මාලදිවයින)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද, වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ මිනිරන් කැණීම් සිදුකරන්නේ පතල් දෙකක පමණි. (නි) / වැ
**7.** ඍතු භේදය නිසා සෞම්‍ය කලාපයේ උෂ්ණත්වය අඩු වැඩි වේ. (නි) / වැ
**8.** සෑම ඛනිජයකම නියත රසායනික සංයුතියක් ඇත. (නි) / වැ
**9.** පාෂාණවල ඝනත්වය, සංයුතිය සහ පිහිටීම අනුව පෘථිවි කබොලේ ප්‍රධාන කොටස් තුනක් ඇත. නි / (වැ)
**10.** භෞතික ජීවන තත්ත්ව දර්ශකය රටක සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන පැරණි මිනුමකි. නි / (වැ)

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය මගින් ප්‍රධාන සංචාරක කලාප ..........**හත / 7**.......... ක් හඳුනා ගෙන ඇත.

**12.** ග්‍රැනයිට් විපරීත වීමෙන් ..........**නයිස්**.......... පාෂාණ නිර්මාණය වේ.

**13.** ..........**ශ්‍රම විභජනය**.........., විශේෂ ප්‍රාගුණ්‍යය හා තාක්ෂණයේ දියුණුව එකලස් කිරීමේ කර්මාන්තයක මූලික පදනම් වේ.


**14.** වර්ග කිලෝමීටරයක ජීවත් වන ජන සංඛ්‍යාව ..........**ජන ඝනත්වය**.......... ලෙස හඳුන්වයි.

**15.** ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන ..........**සංවහන ධාරා**..........වල බලපෑමෙන් භූ තැටි චලනය වේ.

**16.** සාගරවලට සම්බන්ධ වූ හෝ ගොඩබිම්වලින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් වට වූ කරදිය ප්‍රදේශ ..........**මුහුදු**.......... ලෙස හඳුන්වයි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

**ශ්‍රී ලංකාවට ජනවාරි සිට ජුනි දක්වා සංචාරක පැමිණීම් (2023 හා 2025)**




**17.** 2023 වර්ෂයේ වැඩිම සංචාරක පැමිණීම ..........**මාර්තු**.......... මාසයේ දී වාර්තා වී ඇත.

**18.** 2025 වර්ෂයේ අඩුම සංචාරක පැමිණීම ..........**මැයි**.......... මාසයේ දී සිදු වී ඇත.

**19.** 2023 හා 2025 වර්ෂවල සංචාරක පැමිණීම් අතර වැඩිම වෙනසක් දක්නට ලැබෙනුයේ ..........**ජනවාරි**.......... මාසයේ දී ය.

- අංක **20** සිට **25** තෙක් දී ඇති ප්‍රශ්නවල **'අ'** සහ **'ආ'** යනුවෙන් තීරු දෙකක් දැක්වේ. **'අ'** තීරුවේ ඇති තොරතුරු අනුව **'ආ'** තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.** **'අ'** — **ජනාධික කලාපය**

1. දකුණු ආසියාව
2. අග්නිදිග ආසියාව
3. නැගෙනහිර ආසියාව

**'ආ'** — **රට**

A - ඉන්දුනීසියාව
B - චීනය
C - රුසියාව
D - පාකිස්ථානය

(1) A, D, B (2) B, C, A (3) C, A, B (4) D, A, B (…**4**…)

**21.** **'අ'** — **ඛනිජ වර්ගය**

1. බලශක්තිමය ඛනිජ
2. ලෝහමය ඛනිජ
3. ලෝහමය නොවන ඛනිජ

**'ආ'** — **උදාහරණ**

A - යපස්
B - මිනිරන්
C - හුණුගල්
D - ගල්අඟුරු

(1) B, A, D (2) C, B, A (3) D, A, C (4) D, B, C (…**3**…)

**22.** **'අ'** — **ගංගාව**

1. රයින්
2. නයිල්
3. තේම්ස්

**'ආ'** — **ආරම්භය**

A - උල්පතකින්
B - ග්ලැසියර් දිය වූ ජලයෙන්
C - විලකින්
D - කඳුකර ප්‍රදේශයක උල්පතකින්

(1) A, C, B (2) B, C, A (3) C, B, D (4) D, C, A (…**2**…)

**23.** 

| 'අ' සංචාරක කලාපය | 'ආ' නගරය |
|---|---|
| 1. පුරාණ නගර | A - මහනුවර |
| 2. දකුණු වෙරළබඩ | B - හික්කඩුව |
| 3. මධ්‍යම කඳුකරය | C - නුවරඑළිය |
| | D - කතරගම |

(1) A, D, C (2) B, D, C (3) D, B, A (4) D, B, C (…1…)

**24.**

| 'අ' භූ තැටිය | 'ආ' දූපත |
|---|---|
| 1. ඉන්දු-ඕස්ට්‍රේලියානු | A - සුමාත්‍රා |
| 2. යුරේසියන් | B - හවායි |
| 3. දකුණු ඇමරිකානු | C - අන්දමන් |
| | D - ෆෝක්ලන්ඩ් |

(1) A, B, D (2) B, C, A (3) C, A, D (4) D, C, B (…3…)

**25.**

| 'අ' වනජීවී රක්ෂිත | 'ආ' ව්‍යාප්ත ප්‍රදේශ |
|---|---|
| 1. ස්වාභාවික රක්ෂිත | A - වැටහිරියාකන්ද |
| 2. වන රක්ෂිත | B - නාකියාදෙනිය |
| 3. ජාතික උද්‍යාන | C - බූන්දල |
| | D - යාල |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, C, A (…1…)

- අංක **26** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**26.** ලෝක නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත වෙළෙඳපොළ ගැටලුවක් දැක්වෙන වරණය මින් කුමක් ද?
(1) අධික තරගකාරිත්වය නිසා භාණ්ඩවල මිල වෙනස්වීම
(2) බහුජාතික සමාගම්වල බලපෑමට හසුවීම
(3) ශ්‍රම වියදම් ඉහළ යාම
(4) නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා රැකියා හිඟයක් ඇතිවීම (…1…)

**27.** ශ්‍රී ලංකාවට අයත් අනන්‍ය ආර්ථික කලාපය තුළ සිදු කෙරෙන ධීවර කර්මාන්තය හඳුන්වනු ලබන්නේ,
(1) කිවුල්දිය ධීවර කර්මාන්තය නමින් ය.
(2) බහු-දින ධීවර කර්මාන්තය නමින් ය.
(3) මිරිදිය ධීවර කර්මාන්තය නමින් ය.
(4) කරදිය ධීවර කර්මාන්තය නමින් ය. (…4…)

**28.** ශ්‍රී ලංකාවේ වැඩි ම බිම් ප්‍රමාණයක වී වගා කරන්නේ මින් කුමන දිස්ත්‍රික්කයේ ද?
(1) නුවරඑළිය (2) පොළොන්නරුව (3) කුරුණෑගල (4) අනුරාධපුරය (…3…)

**29.** මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ කැපී පෙනෙන ප්‍රවණතාවක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) කුඩා ප්‍රාග්ධන ආයෝජනයකින් පවත්වා ගෙන යා හැකිවීම
(2) රටවල් ඒකාබද්ධ ව නිෂ්පාදන සිදු කිරීම
(3) යුරෝපා රටවල් පමණක් නිෂ්පාදනයේ නියැලීම
(4) නිෂ්පාදන මාදිලි වෙනස් වීමට දිගු කාලයක් ගතවීම (…2…)

**30.** තේ වගාව හා සම්බන්ධයෙන් වැදගත්කමක් උසුලන දකුණු ඇමරිකානු රට වන්නේ මින් කුමක් ද?
(1) බ්‍රසීලය (2) චිලී (3) උරුගුවේ (4) ආර්ජන්ටිනාව (…4…)

**31.** අප්‍රිකා මහාද්වීපයේ ව්‍යාප්තව ඇති ද්විතියික ජන සංකේන්ද්‍රනයක් වන්නේ,
(1) කොංගෝ ද්‍රෝණිය ආශ්‍රිත කලාපය යි.
(2) මධ්‍යම සහරා ප්‍රදේශය යි.
(3) ඊජිප්තුවේ කයිරෝ නගරය ආශ්‍රිත කලාපය යි.
(4) රියෝ ද ජැනෙයිරෝ නගරය ආශ්‍රිත කලාපය යි.
(…**3**…)

**32.** ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජන සංගණනයක් සිදු කරන ලද්දේ,
(1) 1871 දී ය. (2) 1881 දී ය. (3) 1981 දී ය. (4) 2012 දී ය. (…**1**…)

**33.** රටක සංවර්ධන ක්‍රියාදාමයේ දී විකල්ප සම්පත් සෙවීමට සිදුවන්නේ,
(1) ගෝලීය උෂ්ණත්වය වැඩි වන නිසා ය.
(2) ඕසෝන් වියනට හානි සිදු වන නිසා ය.
(3) සම්පත් වේගයෙන් ක්ෂය වන නිසා ය.
(4) සම්පත් ආර්ථික වශයෙන් වටිනා නිසා ය.
(…**3**…)

**34.** 2025 ජනවාරි මාසයේ දී මහත් විනාශයක් සිදු කරමින් දැවැන්ත ලැව් ගින්නක් පැතිර ගියේ ,
(1) ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ය.
(2) කැනඩාවේ ඇල්බර්ටාවල ය.
(3) ඇමසන් වනාන්තර ප්‍රදේශයේ ය.
(4) මධ්‍යම ඕස්ට්‍රේලියානු ප්‍රදේශයේ ය.
(…**1**…)

**35.** 1:50,000 භූ ලක්ෂණ සිතියමක ඉහළ වට තීරුවේ අඩංගු **නොවන** තොරතුරක් වන්නේ මින් කුමක් ද?
(1) සිතියම් වර්ගය
(2) සිතියම් අංකය
(3) සිතියමේ පරිමාණය
(4) සිතියමේ නම
(…**3**…)

**36.** ආපදා කළමනාකරණයට අදාළ ආයතනික ව්‍යුහය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ආපදා කළමනාකරණය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවා ඇත.
B - අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු යටතේ ජාතික ආපදා කළමනාකරණය මධ්‍යස්ථානය පිහිටුවා ඇත.
C - ග්‍රාමීය මට්ටමින් ආපදා කළමනාකරණ කමිටු පිහිටුවා ඇත
D - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු දේශපාලන නායකත්වය යටතේ සිදු වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A, B සහ D පමණක් නිවැරදි ය.
(2) A සහ D පමණක් නිවැරදි ය.
(3) B සහ C පමණක් නිවැරදි ය.
(4) B සහ D පමණක් නිවැරදි ය.
(…**1**…)

**37.** ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බෝට්ටු අපනයනය කරනු ලබන යුරෝපා රටක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රංශය (2) නෙදර්ලන්තය (3) ඉතාලිය (4) නෝර්වේ (…**4**…)

- පහත **A, B, C** හා **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. ස්වාභාවික ආපදා
    2. මානව කටයුතු

B - 1. ආයු අපේක්ෂාව
    2. වියපත් වීම

C - 1. වායු ඝනත්වය
    2. උන්නතාංශය

D - 1. ආගමන
    2. විගමන

**38.** දෙවැන්න වැඩි වන විට පළමුවැන්න අඩු වන මාතෘකා යුගලය කුමක් ද ?
(1) A (2) B (3) C (4) D
(…**3**…)

**39.** පළමුවැන්න වැඩි වන විට දෙවැන්න වැඩිවන මාතෘකා යුගලය කුමක් ද ?
(1) A (2) B (3) C (4) D (…**2**…)

**40.** දෙවැන්නේ බලපෑමෙන් පළමුවැන්න තීව්‍ර වන මාතෘකා යුගලය කුමක් ද ?
(1) A (2) B (3) C (4) D (…**1**…)

* * * *

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம்
Ministry of Education, Higher Education & Vocational Education

| 61 | S | I, II |
|---|---|---|

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)
G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

## භූගෝල විද්‍යාව - II

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් ප්‍රශ්නවලට පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. Ⓐ අක්ෂරයෙන් දැක්වෙන මායිම කුමක් ද?
(පළාත් / දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ) (ලකුණු 01 යි)

ii. Ⓑ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(අඩිපාර / අප්‍රධාන මාර්ගය / කරත්ත පාර) (ලකුණු 01 යි)

iii. Ⓒ අක්ෂරයෙන් දැක්වෙන ජලවහන ලක්ෂණය කුමක් ද?
(කඩොලාන / ගං දහරය / වගුරු බිම) (ලකුණු 01 යි)

iv. Ⓓ අක්ෂරයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
(පාලම / බෝක්කුව / අඩි පාලම) (ලකුණු 01 යි)

v. Ⓔ අක්ෂරයෙන් දැක්වෙන වෙරළ ලක්ෂණය කුමක් ද?
(තුඩුව / වැලිපරය / බොක්ක) (ලකුණු 01 යි)

vi. Ⓖ අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

vii. Ⓗ චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ආගමික සිද්ධස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (viii) හා (ix) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් **'නි'** යන්න ද, වැරදි නම් **'වැ'** යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංක ඉදිරියෙන් ලියා දක්වන්න.

viii. ප්‍රදේශයේ ගංගා නිම්න ආශ්‍රිත ව බහුල ව රබර් වගාව දක්නට ලැබේ. (ලකුණු 01 යි)

ix. Ⓕ අක්ෂරයෙන් දැක්වෙන්නේ ජාතික ඛණ්ඩාංක ඡේදනය වන ස්ථානයකි. (ලකුණු 01 යි)

ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி,உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

**Ministry of Education, Higher Education & Vocational Education**


| 61 | II |
|---|---|

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)

G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)

கல்வி பொதுத் தராதரப் பத்திர(சாதாரண தர)ப் பரீட்சை - பயிற்சி வினாப்பத்திரம் - 2025 (2026)

භූගෝල විද්‍යාව - **Geography** - புவியியல் - II




1:50,000

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - අනුහුරු ප්‍රශ්න පත්‍රය - 2025 (2026)
**G. C. E. Ordinary Level Examination - Model Paper - 2025 (2026)**

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
**Geography** I, II

විභාග අංකය:....................................

1· (අ) / (a)

i. දිස්ත්‍රික්ක — 1

ii. අඩි පාර — 1

iii. වගුරු බිම — 1

iv. බෝක්කුව — 1

v. තුඩුව — 1

vi. පුළුල් ද්විතීය දුම්රිය මාර්ගය — 1

vii. බෞද්ධ සිද්ධස්ථානය — 1

ක්‍රිස්තියානි පල්ලිය — 1

viii. වැ — 1

ix. වැ — 1

10/10

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.


i. තායිවානය - Ⓢ, Ⓣ, Ⓤ
ii. ඕබ් ගඟ - Ⓜ, Ⓝ, Ⓞ
iii. කළු මුහුද - Ⓥ, Ⓦ, Ⓧ
iv. පාමීර් සානුව - Ⓒ, Ⓓ, Ⓔ
v. වැඩ් විල - Ⓟ, Ⓠ, Ⓡ (ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති කොටු යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, යාබද ව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

i. ඒකල - Ⓖ, Ⓗ, Ⓘ
ii. ඩෙල්ෆ්ට් දූපත - Ⓐ, Ⓑ, Ⓒ
iii. සාම්පූර් - Ⓓ, Ⓔ, Ⓕ
iv. ඔක්කම්පිටිය - Ⓞ, Ⓟ, Ⓠ
v. ගිං ගඟ - Ⓛ, Ⓜ, Ⓝ (ලකුණු 05 යි)


(ආ)/(b)




N

| | |
|---|---|
| (i) | T |
| (ii) | O |
| (iii) | X |
| (iv) | D |
| (v) | P |
| | 5 / 5 |

(ඉ)/(c)




N


| | |
|---|---|
| (i) | G |
| (ii) | B |
| (iii) | D |
| (iv) | P |
| (v) | N |
| | 5 / 5 |

---

1. (අ) (a) $\frac{10}{10}$ (ආ) (b) $\frac{5}{5}$ (ඉ) (c) $\frac{5}{5}$ $= \frac{20}{20}$

## II කොටස

2. (i) මෙම රූප සටහනෙහි A හා B ලෙස දක්වා ඇති ලක්ෂණ නිවැරදිව නම් කරන්න.




A - මහාද්වීපික තටකය
B - ආගාධය

**නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 1 බැගින්**
**(ලකුණු 02 යි)**

---

(ii) පහත දැක්වෙන දූපත් පිහිටි සාගර ප්‍රදේශ නම් කරන්න.

(a) කැනරි දූපත්
- අත්ලන්තික් සාගරය

(b) පැපුවා නිව් ගිනියාව
- පැසිෆික් සාගරය

(c) මැඩගස්කරය
- ඉන්දියන් සාගරය

**නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 1 බැගින්**
**(ලකුණු 03 යි)**

---

(iii) (a) කිසියම් රටක් දූපතක් වශයෙන් පිහිටීමෙන් එම රටට ඇති වන **අවාසි දෙකක්** සඳහන් කරන්න.

- සුනාමි තරංගවල බලපෑම
- වෙරළ ඛාදනය සිදු වීම
- සුළි කුණාටුවල බලපෑම
- අමුද්‍රව්‍ය, ආහාර, තෙල්, ඖෂධ වැනි භාණ්ඩ බොහෝමයක් නෞකා හෝ ගුවන් මගින් ගෙන්වා ගැනීමට සිදු වීම
- දේශගුණ වෙනස් වීම්වලින් අධික බලපෑම් ඇති වීම
  - මුහුදු මට්ටම ඉහළ යාම
  - ලවණතාව වැඩි වීම
  - වෙරළ කලාප යට වීම
  - වගා භූමි කෙරෙහි ඇතිවන බලපෑම්
- ආර්ථිකයන් ධීවර කර්මාන්තය, වරාය සහ සංචාරක කර්මාන්ත මත රඳා පැවතීම
- කුඩා දේශීය වෙළඳපොළක් පැවතීම
- ගෝලීය දේශපාලනය තුළ බොහෝ විට සීමිත බලපෑමක් තිබීම
- ස්වාභාවික සම්පත් සීමිත වීම

**යනාදි වශයෙන් අවාසි දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 02 යි**

(b) සාගරික ප්‍රදේශයක් හිමි රටවල් සාගරය පදනම් කර ගෙන සිදු කරන ආර්ථික කටයුතු **තුනක්** ලියා දක්වන්න.

- ධීවර කර්මාන්තය, මත්ස්‍ය වගාව සහ මුහුදු ආහාර නිෂ්පාදනය
- සාගරික ප්‍රදේශවලින් ඛනිජ තෙල් හා ස්වාභාවික වායු වර්ග ලබා ගැනීම
- වරායන්, නැව් තැනීම, සේවාවන් සැපයීම සහ නඩත්තුව වැනි කටයුතු
- වෙරළබඩ සුළං බලාගාර, උදම් සහ තරංග ශක්තිය, පාවෙන සූර්ය පැනල ආදිය මගින් බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීම
- කොරල්පර, ඛනිජ ලවණ, වැලි නිස්සාරණය, මුහුදු ලුණු නිෂ්පාදනය, සමුද්‍ර ජෛව තාක්ෂණය ආදිය
- සංචාරක කර්මාන්තය

**යනාදි ආර්ථික කටයුතු තුනක් සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 03 යි**
**(ලකුණු 05 යි)**

3. (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවන වායුගෝලයට එකතුවන අහිතකර වායු වර්ග **දෙකක්** නම් කරන්න.

- නයිට්‍රස් ඔක්සයිඩ් $N_2O$
- මීතේන් $CH_4$
- කාබන්ඩයොක්සයිඩ් $CO_2$
- ක්ලෝරෝ ෆ්ලෝරෝ/ෆ්ලුවරෝ කාබන් CFC

**මින් දෙකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 1 බැගින්**
**(ලකුණු 02 යි)**

---

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමෙන් ඇතිවිය හැකි අහිතකර බලපෑම් **තුනක්** දක්වන්න.

- ධ්‍රැවීය අයිස් දිය වීම හා සාගර ජල මට්ටම ඉහළ යාම
- කලපු විනාශ වීම හා ජලය ලවණීකරණය වීම
- සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වීම නිසා ජලජ ජීවීන් විනාශ වීම
- සාගර මතුපිට උෂ්ණත්වය වැඩි වීම නිසා සුළි කුණාටු ඇති වීම
- ඇතැම් ජීවීන් වඳ වීම
- සත්ත්ව ජාන විකෘති වීම
- බෝග විනාශය හා අස්වැන්න අඩු වීම

**යනාදි අහිතකර බලපෑම් තුනක් නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 1 බැගින්**
**(ලකුණු 03 යි)**

---

(iii) දේශගුණ වෙනස් වීම් අවම කර ගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාර **තුනක්** නම් කර ඉන් **එකක්** විස්තර කරන්න.

- හරිතාගාර වායු පිට කරන බලශක්ති පරිහරණය අවම කිරීම
- පුනර්ජනනීය බලශක්ති භාවිතයට යොමු වීම
- බෝග වගාව සඳහා රසායනික පොහොර වෙනුවට ජෛවීය පොහොර භාවිත කිරීම පිළිබඳ දැනුම්වත් කිරීම
- ඝන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම / නිසි ලෙස කළමනාකරණය
- වන වගා ව්‍යාප්ත කිරීමට උදව් කිරීම
- මිශ්‍ර භෝග බහු බෝග වගාවන් සිදු කිරීම
- මිතුරන්, නෑදෑයන්, අසල්වැසියන්, පවුලේ සාමාජිකයන් දැනුම්වත් කිරීම
- පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීම
- 3 R සංකල්පය ක්‍රියාත්මක කිරීම

**යනාදී වශයෙන් දායක විය හැකි ආකාර තුනක් දැක්වීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි**
**ඉන් එකක් විස්තර කිරීමට - ලකුණු 02 යි**
**(ලකුණු 05 යි)**

4. (i) පහත දැක්වෙන උපද්‍රව වර්ග සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.

(a) භූ විද්‍යාත්මක උපද්‍රව
- භූමිකම්පා
- සුනාමි
- ගිනි කඳු
- නායයෑම්

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(b) ජීව විද්‍යාත්මක උපද්‍රව
- වසංගත රෝග
- ලැව් ගිනි
- ශාක හා සත්ත්ව වඳ වීම්

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**
**(ලකුණු 02 යි)**

---

(ii) පහත සාගරික කලාපවල ඇතිවන සුළි කුණාටු හඳුන්වනු ලබන නම් නිවැරදිව දක්වන්න.

(a) උතුරු අත්ලන්තික් සාගර ප්‍රදේශයේ දී
- හරිකේන්

**නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(b) බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරයේ දී
- සුළි සුළං
- සයික්ලෝන්
- වාසුළි

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(c) පිලිපීන දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ දී
- බැගියෝ

**නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**
**(ලකුණු 03 යි)**

---

(iii) ආපදා කළමනාකරණ චක්‍රයට අනුව ශ්‍රී ලංකාවේ නායයෑම් ආපදාව කළමනාකරණය කිරීමේ දී,

(a) අවම කිරීමේ ක්‍රියාමාර්ග **දෙකක්**

- අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කිරීම
- ප්‍රජාව දැනුවත් කිරීම
- අවදානම් කලාප තක්සේරු කර ජනතාව එම ප්‍රදේශවලින් ඉවත් කිරීම
- ආපදාව අවම කර ගැනීමට හැකි මෙවලම් ලබා දීම
- ආපදා කළමනාකරණ අවශ්‍යතා ශක්තිමත් කිරීම

**යනාදි අවම කිරීමේ ක්‍රියාමාර්ග දෙකක් නම් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 02 යි**

(b) යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග තුනක් දක්වන්න.

- ඔවුන් ආරක්ෂිත ස්ථාන කරා රැගෙන යාම
- ආපදාවට ලක්වූවන්ට අවශ්‍ය ආහාර ජලය නවාතැන් පහසුකම් තාවකාලිකව ලබා දීම
- ආපදාවට ලක්වූවන්ට අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම
- ආපදාවට ලක්වූවන් මානසික වශයෙන් යථා තත්ත්වයට පත් කිරීම
- දිගු කාලීන වශයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

**යනාදි ක්‍රියාමාර්ග තුනක් නම් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 03 යි**
**(ලකුණු 05 යි)**

5. (i) පෘථිවියේ දක්නට ලැබෙන,

(a) ක්ෂය වන සම්පතක්
- පොසිල ඉන්ධන
- වනාන්තර
- පාෂාණ
- සරු පස
- ලෝහමය ඛනිජ (යපස්/තඹ/රන්)
- අලෝහමය ඛනිජ (ගල් අඟුරු/මැණික්/සිලිකා)

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(b) පුනර්ජනනීය සම්පතක් නම් කරන්න.
- ජලය
- සූර්යාලෝකය
- වාතය

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**
**(ලකුණු 02 යි)**

---

(ii) වරහන් තුළ දක්වා ඇති පාෂාණ අතුරෙන්,
(මිනිරන් / බැසෝල්ට් / ගල් අඟුරු / ගැබ්රෝ / ජිප්සම් / ඩොලමයිට්)

(a) ආග්නේය පාෂාණයක්
- බැසෝල්ට් / ගැබ්රෝ

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(b) අවසාදිත පාෂාණයක්
- ගල් අඟුරු / ජිප්සම්

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(c) විපරීත පාෂාණයක් බැගින් තෝරා ලියන්න.
- මිනිරන් / ඩොලමයිට්

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

**(ලකුණු 03 යි)**

---

(iii) පරිසරයේ ඇති ස්වාභාවික සම්පත් මිනිසා විසින් වටිනා සම්පතක් බවට පරිවර්තනය කරන ආකාර **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- පාෂාණ - නිෂ්පාදන කර්මාන්තවල අමුද්‍රව්‍ය ලෙස භාවිත කිරීම, පිළිම නෙලීම, මාර්ග හා ඉදිකිරීම් කටයුතු
- භූමිය - ඉදිකිරීම්, ජනාවාස, කෘෂි භෝග වගාව, ඛනිජ කැණීම
- ජලය - ජල විදුලිය නිපදවීම, ප්‍රවාහනය, ජල සම්පාදනයෙන් කෘෂි කටයුතු, විවිධ පර්යේෂණ
- වනාන්තර - දැව කර්මාන්තය, ලී බඩු නිෂ්පාදනය, සංචාරක කර්මාන්තය

**යනාදී වශයෙන් සම්පතක් බවට පරිවර්තනය කරන ආකාර තුනක් දැක්වීමට ලකුණු 01 බැගින් - ලකුණු 03 යි**
**නිදසුන් දෙකක්වත් දැක්වීමට - ලකුණු 02 යි**
**(ලකුණු 05 යි)**

6. (i) (a) ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීම සඳහා පිහිටුවා ඇති පර්යේෂණ මධ්‍යස්ථානයක් නම් කරන්න.

- අඹේවෙල
- කනන්විල

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**

(b) සෞම්‍ය කලාපීය ප්‍රදේශවල කිරිපට්ටි පාලනය දියුණු වීම සඳහා බලපෑ සාධකයක් දක්වන්න.

- තණබිම්වල ව්‍යාප්තිය
- ජල පහසුව
- පුහුණු ශ්‍රමය
- නව තාක්ෂණය
- වෙළඳපොළ

**මින් එකක් නිවැරදිව නම් කර ඇත්නම් ලකුණු 01 යි**
**(ලකුණු 02 යි)**

---

(ii) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න.

- ගුණාත්මක කිරි දෙනුන් මිල දී ගැනීමට ණය පහසුකම් ලබා දීම
- ප්‍රාදේශීය වශයෙන් කිරි රැස් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම
- කිරි මිල දී ගැනීමට සහතික මිලක් නියම කිරීම
- කුඩා කණ්ඩායම් කිරි ගොවි සමිති පිහිටුවීම
- පශු වෛද්‍ය සේවා පහසුකම් ලබා දීම
- ආහාර හා ඖෂධ වර්ග ලබා දීම / දැනුම්වත් කිරීම
- තෘණ වර්ග (ඇල්පැල්ෆා වැනි) හඳුන්වා දීම

**යනාදී ක්‍රියාමාර්ග තුනක් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින්**
**(ලකුණු 03 යි)**


---

(iii) ගෝලීය දේශගුණ වෙනස් වීම් සත්ත්ව පාලන කටයුතු කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් **තුනක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න.

- වර්ෂාපතනය අධික වීමෙන් ලෙඩ රෝග ව්‍යාප්තිය වැඩි වීම
- නියඟ හේතුවෙන් ජල හිඟය නිසා සතුන් මිය යාම
- අධික උෂ්ණත්වය දරා ගත නොහැකිව (Heat Strokes) සතුන් මිය යාම
- උෂ්ණත්වය වැඩි වීම සතුන්ගේ බර, අභිජනන ක්‍රියාවලීන්ට බලපෑම් ඇති කිරීම
- සතුන්ට පහසුකම් සැපයීමට වියදම් දැරීමට සිදු වීම
- නිෂ්පාදන කල් තබා ගැනීම අසීරු වීම (මස්, කිරි, බිත්තර ආදිය)
- සත්ත්ව ගොදුරු බිම් විනාශ වීම
- නව රෝග වර්ග ව්‍යාප්ත වීම

**යනාදී බලපෑම් තුනක් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 03 යි**
**ඉන් එකක් විස්තර කර ඇත්නම් - ලකුණු 02 යි**
**(ලකුණු 05 යි)**

7. (i) ශ්‍රී ලංකාවේ විදුලි බලාගාර කිහිපයක් මෙම සිතියමෙහි ලකුණු කර ඇත. ඒවා අතුරෙන්,




(a) සූර්ය බලාගාරයක්
- D බරුතකන්ද

**අක්ෂරය සහිතව නම් කර ඇත්නම් ලකුණු 01 යි**
**(අක්ෂරය පමණක් දක්වා ඇත්නම් ලකුණු ½ යි)**
**(නම පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා නො දෙන්න)**

(b) තාප බලාගාරයක් අක්ෂරය සමඟ නිවැරදිව නම් කරන්න.
- B කෙරවලපිටිය

**අක්ෂරය සහිතව නම් කර ඇත්නම් ලකුණු 01 යි**
**(අක්ෂරය පමණක් දක්වා ඇත්නම් ලකුණු ½ යි)**
**(නම පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා නො දෙන්න)**
**(ලකුණු 02 යි)**

---

(ii) බලශක්තිය ක්‍රමවත් භාවිත කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න.

- අනවශ්‍ය විදුලි පහන්, පංකා නිවා දැමීම
- කාර්යක්ෂම විදුලි බල්බ (LED) භාවිත කිරීම
- හයිබ්‍රිඩ්/විදුලි (Hybrid/EV) වාහන භාවිතා කිරීම
- අබලන් වූ විදුලි උපකරණ භාවිතය අවම කිරීම හා අලුත්වැඩියා කිරීම
- විදුලිය අධික ලෙස වැය වන යන්ත්‍ර සූත්‍ර භාවිතය සීමා කිරීම (විදුලි ස්ත්‍රික්ක/විදුලි කේතල/ශීතකරණ/වායු සමීකරණ යන්ත්‍ර/රෙදි සෝදන යන්ත්‍ර ආදිය)
- පුනර්ජනනීය බලශක්ති භාවිතය වැඩි කිරීම හා ප්‍රවර්ධනය කිරීම
- පොදු ප්‍රවාහන සේවා භාවිතය
- 3 R සංකල්පය ක්‍රියාත්මක කිරීම

**යනාදී ක්‍රියාමාර්ග තුනක් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින්**
**(ලකුණු 03 යි)**

---

(iii) ශ්‍රී ලංකාවේ බලශක්ති පරිහරණයේ දී මතු වන ගැටලු **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** විස්තර කරන්න.

- ආනයනික ඉන්ධන මත අධික ලෙස රඳා පැවතීම
- බලශක්ති ගාස්තු ඉහළ වීම
- පිරිවැය අධික වීම
- ස්වාභාවික ආපදා මගින් හානි සිදු වීම
- බලශක්ති පරිහරණයේ දී නාස්තිය වැඩි වීම
- බලශක්ති සංරක්ෂණය පිළිබඳ දැනුම්වත් භාවය නොමැති වීම
- යන්ත්‍ර සූත්‍ර, වාහන පැරණි වීම නිසා ඉන්ධන භාවිතය වැඩි වීම
- පුනර්ජනනීය බලශක්ති ලබා ගැනීමේ මූලික වියදම් වැඩි වීම

**යනාදී ගැටලු තුනක් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 03 යි**
**ඉන් එකක් විස්තර කර ඇත්නම් - ලකුණු 02 යි**
**(ලකුණු 05 යි)**

8. (i) 2024 ජන සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ
(a) ජන සංඛ්‍යාව වැඩි ම දිස්ත්‍රික්කය
- ගම්පහ

**ලකුණු 01 යි**

(b) ජන සංඛ්‍යාව අඩු ම දිස්ත්‍රික්කය නම් කරන්න.
- මුලතිව්

**ලකුණු 01 යි**
**(ලකුණු 02 යි)**

---

(ii) ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන,
(a) භෞතික සාධකයක්
- දේශගුණය
- ජලය
- භූ විෂමතාව
- ස්වාභාවික සම්පත්

**මින් එකක් නිවැරදිව දක්වා ඇත්නම් - ලකුණු 01 යි**

(b) මානව සාධක **දෙකක්** දක්වන්න.
- නාගරීකරණය
- කාර්මීකරණය
- සන්නිවේදනය
- ප්‍රවාහනය

**මින් දෙකක් නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 02 යි**
**(ලකුණු 03 යි)**

---

(iii) සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනය හේතුවෙන් මතු වී ඇති ගැටලු **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න.

- නාගරික ප්‍රදේශවල ජනගහන තදබදය වැඩි වීම
- රැකියා ආශ්‍රිත ගැටලු
- ස්වාභාවික සම්පත්වලට ඇතිවන පීඩනය වැඩි වීම
- පරිසර දූෂණය ඉහළ යාම
- සමාජ අසමානතා ඉහල යාම
- රජයේ වියදම් වැඩි වීම සහ ආර්ථික පීඩනය වැඩි වීම
- යටිතල පහසුකම් සැපයීමේ ගැටලු ඇතිවීම
- නිවාස හිඟය / නාගරික පැල්පත් වර්ධනය වීම
- අක්‍රමවත් සංවර්ධනය
- තරුණ අසහනය වැඩි වීම
- ආහාර නිෂ්පාදන ගැටලු ඇති වීම
- රථවාහන තදබදය වැඩි වීම
- අපරාධ/විෂමාචාර යනාදිය වැඩි වීම

**යනාදී ගැටලු තුනක් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු 1 බැගින් - ලකුණු 03 යි**
**ඉන් එකක් විස්තර කර ඇත්නම් - ලකුණු 02 යි**
**(ලකුණු 05 යි)**

*****